යම් ස්ථානයකට ගොඩ බැස "අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා ඛලක්" යනුවෙන් කවරෙකු පවසා සිටියේ ද එම ස්ථානයෙන් ඔහු නැවත ගමන් කරන තෙක් ඔහුට කිසිදු හානියක් සිදු වන්නේ නැත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කරමින් සිටි ප්රකාශයකට තමන් සවන් දුන් බව පවසමින් කව්ලා බින්ති හකීමිස් සුලමිය්ය තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. "යම් ස්ථානයකට ගොඩ බැස "අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා ඛලක්"
යනුවෙන් කවරෙකු පවසා සිටියේ ද එම ස්ථානයෙන් ඔහු නැවත ගමන් කරන තෙක් ඔහුට කිසිදු හානියක් සිදු වන්නේ නැත." [صحيح] [رواه مسلم]

යම් භූමියකට ගොඩ බැස්ස විට මිනිසාට බිය ඇති කරන සෑම අනතුරුදායක දැයින්ම රැකවරණය ලබන ප්රයෝජනවත් රැකවරණයක් හා ආරක්ෂාවක් වෙත නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ තම ප්රජාවට මඟ පෙන්වූහ. එය ඔහු ගමනක යෙදී සිටියත්, විනෝද චාරිකාවක යෙදී සිටියත්, වෙනත් යම් කරුණක යෙදී සිටියත් එක හා සමානය. එය මහිමයෙන්, ආශිර්වාදයෙන් හා ප්රයෝජනයෙන් පිරුණු අල්ලාහ්ගේ පරිපූර්ණ වදන් තුළින් සෑම අඩුපාඩුවකින්ම හානිදායක, සෑම මැවීමකින්ම ආරාක්ෂාව පැතීමෙනි. එවිට ඔහු අදාළ ස්ථානයේ නවාතැන් ගන්නා කාලය පුරාවට ඔහුට හානි ගෙන දෙන සෑම දෙයකින්ම ආරක්ෂාව ලබනු ඇත.

http://sunnah.global/hadeeth/si/show/5932